පේදුරුතුඩුව නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 21 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පේදුරුතුඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 අනුකූල නොවීම්

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත vi කොටසේ 157 වගන්තියේ අංක 6(උ) | 80,450 | අනුමත නොකළ දැන්වීම් පිළිබඳ ආදායම් පරීක්ෂක විසින් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | නගර සභා මූල්‍ය රීති | | |
| (i) | III පරිච්ඡේදයේ 54(1) වගන්තිය | | සමාලෝචිත වර්ෂය සඳහා වූ වරිපනම් හා බදු උපලේඛන නොවැම්බර් 15 දිනට පෙර ලේකම් වෙත භාරදී දෙසැම්බර් 15 දිනට ගෙවීම්කර නොතිබුණි. |
| (ii) | III පරිච්ඡේදයේ 54(2) වගන්තිය | 1,079,108 | සභා ඉඩම්වල කුලී ගාස්තු නියමිත කාලය තුළ අයකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 1646 | සමාලෝචිත වර්ෂය සඳහා වූ එක් එක් මාසය සඳහා වූ වාහන ධාවන සටහන් පසු මාසයේ 15 දිනට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.42,380,315 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,497,752 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 1,085,000 | - | 10,330,511 | 6,639,377 | 985,100 | - | 1,078,354 | 3,341,985 |
| (ii) කුලී | 17,000,000 | - | 9,023,727 | - | 16,093,334 | - | 9,111,586 | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,450,000 | - | 1,046,390 | - | 560,000 | - | 876,419 | - |
| (iv)වෙනත් ආදායම් | 21,281,500 | - | 29,713,454 | 44,416,505 | 20,352,000 | - | 24,993,714 | 41,792,628 |
| එකතුව | 40,816,500 | - | 50,114,082 | 51,056,182 | 37,990,434 | - | 36,060,073 | 45,134,613 |

#### 2.2.2. වරිපනම් හා බදු

-----------------

එකතුව රු.5,911,223 ක්වූ හිඟ වරිපනම් හා බදු අයකරගැනීම සඳහා පසුගිය වසර 01 සිට 10 වසරක් දක්වා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 උසාවි දඩ සහ මුද්දර ගාස්තු

-----------------------------

රු.732,767 ක්වූ උසාවි දඩ සහ රු.10,783,426 ක්වූ මුද්දර ගාස්තු උතුරු පළාතේ ප්‍රධාන ලේකම් වෙතින් 2017 දෙසැම්බර් 31 දින වන විට දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්යසාධනය

----------------

නගර සභා ආඥා පනතේ 4 වගන්තිය පරිදි මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංවාවත් පිළිබඳ සියලු කරුණු පාලනය කිරීම් සහ පරිපාලනය කිරීම සහ සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම් සහ සුහසාධනය සහ නගරයේ සැපවිහරණ ක්‍රම ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම පිළිබඳ හෙළිවූ කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------

රැස්කළ ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම් සිදු නොකර බැහැර කිරීම් පෙදෙස්වල දමා තිබුණි.

(ආ) අත්හැර දැමූ කටයුතු

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභා අරමුදලින් රු.4,768,900 ක මුදලකට ඇස්තමේන්තු කරන ලද මාර්ග තුනක් සඳහා වූ සංවර්ධන වැඩ යෝජනා ක්‍රම, ආරම්භ කිරීමෙන් තොරව අත්හැර දමා තිබුණි.

.3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------

රු.270,900 ක පිරිවැයකට පුලෝලි ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් මිලටගත් ට්‍රැක්ටර් රථයේ අයිතිය පසුගිය වසර 12 පුරාම සභාව නමින් පවරාගෙන නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

සභාව මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම හා යෙදවීම සිදුකර නොමැති බැව් විගණනයේදී නිරීක්ෂණය වුයෙන් මානව සම්පත් 15 ක් විසින් නිම කළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

ඉදිකිරීම් සිදුකොට සභාවට භාරදුන් කඩකාමර 13 ක් කුලියට දීම සඳහා පසුගිය වසර හතරක් පුරාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

---------------------------------

සභාවේ ගලි බවුසරය භාවිතා කරමින් අපජලය බැහැර කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ගයක් නොගෙන ගලි බවුසර්යක් කුලියට ගැනීම සඳහා එකතුව රු.6,117.90 ක් වූ මුදලක් පුද්ගලයෙකුට ගෙවා තිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

--------------------------

ඌන උපයෝජන වත්කම්

---------------------------

ද්විත්ව රෝද ට්‍රැක්ටරයක් භාවිතයට ගැනීම සඳහා පසුගිය වසර පහ පුරාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.7 හඳුනානොගත් පාඩු

-----------------------

හිටපු ගබඩා භාරකරු විසින් භාරදී නොමැති රු.1,217,769 ක් වටිනා යන්ත්‍ර දෙකක් පිළිබඳව සභාව විසින් පසුගිය වසර පහ පුරාම අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4. වගකීම් භාරය සහ යහපාලනය

--------------------------------

අයවැය පාලනය

-----------------

අයවැය ගත ආදායම් හා තත්‍ය ආදායම් අතර රු.132,945 සිට රු.10,189,498 හෙවත් සියයට 12 සිට සියයට 59 දක්වා සහ අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර රු.80,172 සිට රු.8,442,928 හෙවත් සියයට 17 සිට සියයට 42 දක්වා පරාසයක විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | ක්‍රියාකාරී සැලැස්ම, මිණුම්පත්‍ර ලේඛනය, ඉඩම් විකුණුම්මත බදු ලේඛනය සහ පාඩු ලේඛනය නඩත්තු කිරීමට අසමත් වීම. |